**විසර්ජන ශීර්ෂය 143 - පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශය**

**විගණකාධිපති වාර්තාව - 2012 වර්ෂය**

**1.1 විගණන විෂය පථය**

පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශයේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන පොත් පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2013 මැයි 30 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදි. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනුවල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය , අනෙකුත් සම්පත් හා කාල වේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

**1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසිවලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

**1.3 විගණන නිරීක්ෂණ**

2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය වාර්තා හා පොත් අනුව පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යාංශයේ විසර්ජන ගිණුම මෙහි (අ) පොදු නිරීක්ෂණය සහ පහත 1.4 සිට 1.8 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

**(අ) පොදු තැන්පත් ගිණුම්**

2012 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශයේ පොදු තැන්පත් ගිණුමේ ශේෂය රු. 3,692,822 ක් විය.

## 1.4 යහ පාලනය හා ගිණුම් කටයුතුභාවය

### 1.4.1 සංයුක්ත සැලැස්ම

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්, පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන් , දෙපාර්තමේන්තු ප්‍රධානීන්, දිස්ත්‍රික් ලේකම්වරුන් හා පළාත් පාලන ආයතන ප්‍රධානීන් අමතන ලද 2010 මාර්තු 10 දිනැති අංක පීඑෆ්/ආර්/2/2/3/5(4) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය ප්‍රකාරව 2010 වර්ෂයේ සිට ඉදිරියට අවම වශයෙන් වර්ෂ 03 ක් සඳහා සංයුක්ත සැලස්මක් අමාත්‍යාංශය විසින් වර්ෂය ආරම්භයේදී පිළියෙල කල යුතු වුවත්, 2012 වර්ෂය සඳහා පමණක් සංයුක්ත සැලැස්ම පිළියෙල කර තිබුණි.

### 1.4.2 අභ්‍යන්තර විගණනය

අභ්‍යන්තර විගණන ඒකකය සඳහා ගණකාධිකරණ සේවයේ තනතුරක් අනුමත කර ඇතත් එම තනතුර පුරප්පාඩුව පැවති අතර ගිණුම් සහකාර නිලධාරිනියක් මෙම ඒකකයේ කටයුතු සිදුකර තිබුණි.

## 1.5 වත්කම් කළමනාකරණය

### (අ) බේරුම් නොකළ බැරකම්

*අමාත්‍යාංශය* විසින් 2012 දෙසැම්බර් 31 දිනට බේරුම් නොකළ බැරකම් රු.22,704,944 ක් වු අතර, ඊට ඇතුලත් රු. 4,762,502ක් වු ශේෂය වසරකට වැඩි කාල පරිච්ඡේදයකට අදාල විය.මන්ත්‍රී කාර්ය මණ්ඩලය සඳහා මන්ත්‍රීවරුන් විසින් පත් කර ගන්නා අමාත්‍යාංශ,දෙපාර්තමේන්තු,සංස්ථා සහ මණ්ඩල ආදී සේවකයන්ට ඒ ඒ කාර්යාල වලින් ගෙවන ලද වැටුප් , අමාත්‍යාංශයට ඉදිරිපත් කර නිරවුල් කිරීම අදාල සේවකයන්ගේ ස්ථිර කාර්ය ස්ථානයෙන් කළ යුතු වුවත් එම කටයුතු වල ප්‍රමාදය නිසා මෙම තත්ත්වය ඇති වී තිබූ බව විගණනයේදී අනාවරණය විය.

## 1.6 අනුකූල නොවීම්

### නීති,රීති,රෙගුලාසි යනාදියට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණ වලදී නිරීක්ෂණය වූ නීත, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නීති, රීති හා රෙගුලාසිවලට යොමුව. | වටිනාකම<br>රු. | අනුකූල නොවීම |
|---|---|---|---|
| (i) | ආයතන සංග්‍රහය | | |
| | xxiv පරිච්ඡේදයේ 3.5.1 වගන්තිය : | 158,250 | ණය සඳහා අඩුකර ගනු ලබන මුළු මුදල වැටුපෙන් 40% නොඉක්මවිය යුතු වුවත් එම සීමාව ඉක්මවා ණය ලබා දී තිබුණි. |
| (ii) | මුදල් රෙගුලාසි | | |
| | මු.රෙ. 371 (2 ) (ආ ) | 837 .000 | තත්කාර්ය අතුරු අග්‍රිම සීමාව ඉක්මවා අග්‍රිම ලබා දී තබුණි. |
| | මු.රෙ. 371 (2) (ඇ) | 288,000 | අදාල කාර්යය නිමකල විගසම අතුරු අග්‍රිම නිරවුල් කළ යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. |
| (iii) | රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ | | |
| | 1994 අගෝස්තු 10 දිනැති අංක 96 දරන චක්‍රලේඛයේ 3 ජේදය | 176,700 | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව ණය ශේෂ කණ්ඩායම් අනුව වර්ග කර සාරාංශ කර නොතිබුණි. |

## 1.7 කළමනාකරණ දුර්වලතා

2003 වර්ෂයේදී පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට කෂය පදනම මත වාහන ලබාදී තිබූ අතර ඔවුන්ගේ මන්ත්‍රී ධුරඅහෝසි වීම මත අයකර ගැනීම් කටයුතු නිසියාකාරව සිදු වී නොතිබුණි. ඉන්පසු මෙම මන්ත්‍රී වරුන්ගෙන් තිදෙනෙක් මිය ගොස් ඇති අතර ඔවුන්ගෙන් 2012 දෙසැම්බර් 31 දින වන විට රු. 1,231,421 ක් හා මන්ත්‍රී ධූරය අහෝසි වීම මත මන්ත්‍රීවරයකුගෙන් රු. 299,605 ක් අයවිමට ඇති බව නිරීක්ෂණය විය.

1.8 **මානව සම්පත් කළමනාකරණය**

(අ) **අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා**

2012 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| (i) ජ්‍යෙෂ්ඨ මට්ටම | 08 | 06 | 02 |
| (ii) තෘතියික මට්ටම | 03 | 01 | 02 |
| (iii) ද්විතියක මට්ටම | 33 | 24 | 09 |
| (iv) ප්‍රාථමික මට්ටම | 19 | 17 | 02 |
| එකතුව | 63 | 48 | 15 |

පහත සඳහන් නිරීක්ෂණයන් කරණු ලැබේ.

(i) සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 15 ක් පිරවීමට *කටයුතු කර නොතිබුණි.*